පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය:- නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය

සතිය- 15

ශ්‍රේණිය :- 11

Prepared by-කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

පුනරීක්ෂණ අභ්‍යාස

1) ලෝහ භාණ්ඩවල ආරක්ෂාවට හා සෞන්දර්යාත්මක අගය ඉස්මතු කිරීම සඳහා සිදුකරනු ලබන ඔක්සිඩයිස් කිරීම මඟින් සිදුවන වාසි 3ක් ලියන්න.

2) ලෝහ වර්ණ ගැන්වීම සඳහා යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය 3ක් නම් කරන්න.

3) 60°, 120°, 45° කෝණ නිර්මාණය කරන්න.

4) තුනී තහඩුවකින් සකස් කරන ලද විශ්කම්භය 50mm හා උස 60mm වූ කුහර සිලින්ඩරයක විකසන හැඩය අඳින්න.

5) වානේ වර්ග නිපදවීමට ගන්නා ඌෂ්මන වර්ග මොනවාද?

6) එන්ජිමක් තුල ක්‍රියාත්මක වන සලගිල්ල, කැටි දණ්ඩ, හා පිස්ටනය යන උපාංග ක්‍රියාත්මක වීමේදී ඒවායේ සිදුවන චලිත අනුපිළිවෙලින් ලියන්න.

7) ජල සිසිලන ක්‍රමය සහිත එන්ජිමකට වඩා වා සිසිලන එන්ජිමක ඇති වාසි හා අවාසි දෙක බැගින් ලියන්න.

8) ස්නේහක වර්ග 02ක් සඳහන් කොට ස්නේහක තෙල් වලින් ඉටුකෙරෙන කාර්යන් 02ක් ලියන්න.

9) ලීවර හා රුහැන් භාවිතයෙන් ක්‍රියාත්මක වන වාහන කිරිංග වර්ගය කුමක්ද?

10) එන්ජිමක ජල පොම්පයක අක්ෂ දණ්ඩ අසලින් ජලය කාන්දු වීම නිරීක්ෂණය කරන ලදි එයට හේතුව සඳහන් කර එය නිවැරදි කිරීමට ගත යුතු ක්‍රියාමාර්ගය ලියා දක්වන්න.